සියලු හිමිකම් ඇවිරිණි/ All Rights reserved

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව Provincial Department of Education

**වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව**

**Provincial Department of Education - NWP**

**60 S II**

පළමු වාර පරීක්ෂණය - 10 ශ්‍රේණිය - 2018

First Term Test - Grade 10 - 2018

**විභාග අංකය ....................................** **ව්‍යාපාර හා ගිණුම්කරණ අධ්‍යයනය - II** **කාලය පැය 02 යි**

**වැදගත් :**

- **සියලුම ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.**

(01) පහත සඳහන් සිද්ධිය අධ්‍යයනය කර දී ඇති ප්‍රශ්න වලට කෙටි පිළිතුරු සපයන්න.

ප්‍රසන්න සිල්වා අ.පො.ස (සා/පෙළ) විභාගය දක්වා පාසල් අධ්‍යාපනය ලැබුවෙකි. ඉන් අනතුරුව ඔහු වඩු කාර්මිකයෙකු ලෙස වෘත්තිය ජීවිතය ආරම්භ කරන ලදී. වඩු කර්මාන්තයේ යෙදෙන මොහුගේ විශේෂ දක්ෂතාවය නම් කැටයම් කැපීමේ කලාව පිළිබඳ නිපුණතාවයයි. මොහු කැටයම් කලාව පිළිබඳ ජාතික වෘත්තීය පුහුණු අධිකාරියේ පුහුණු පාඨමාලාවක්ද හදාරන ලදී. ඉතා හොඳින් ව්‍යාපාර කටයුතු කරගෙන ගිය මොහු තමන් නිෂ්පාදනය කරන ගෘහභාණ්ඩ වැනි දෑ තම කර්මාන්තශාලාව ඉදිරිපිට අලෙවි කිරීමේ මධ්‍යස්ථානයක් "මනහර ගෘහ භාණ්ඩ නිෂ්පාදකයෝ" නමින් ආරම්භ කරන ලදී. එමෙන්ම ඔහුගේ කර්මාන්තශාලාවේ සහ වෙළඳසැලේ සේවයට සේවක සේවිකාවන් 10ක් පමණද බඳවා ගන්නා ලදී. අනතුරුව තම ප්‍රදේශයේ වාණිජ බැංකුවකින් ණය මුදලක් ලබාගෙන තම ව්‍යාපාරය පුළුල් කිරීමටද අදහස් කරන ලදී.

1. මෙම ව්‍යාපාරය මගින් සම්පූර්ණ කරනු ලබන මිනිස් අවශ්‍යතා හා වුවමනා සපුරාලීම සඳහා නිෂ්පාදනය කරන භාණ්ඩ වල දැකිය හැකි ලක්ෂණ දෙකක් ලියන්න.
2. නිෂ්පාදිත වල ස්වභාවය අනුව මෙම ව්‍යාපාරය කුමන වර්ගයට අයත් වේද?
3. මෙම ව්‍යාපාරයට සම්බන්ධව ප්‍රසන්න සිල්වා තුළ දැකිය හැකි ශක්තියක් නම් කරන්න.
4. ඉහත සඳහන් ව්‍යාපාරය තුළ දැකිය හැකි භූමිය සහ ශ්‍රමය යන නිෂ්පාදන සාධක වලට අයත් වන සාධක දෙකක් නම් කරන්න.
5. එම ව්‍යාපාරය කෙරෙහි ඇල්මැති පාර්ශව දෙකක් කම් කරන්න.
6. මොහුගේ ව්‍යාපාරයේ බාහිර පරිසරයට අයත් සාධක දෙකක් නම් කරන්න.
7. මොහුගේ ව්‍යාපාරය ලියාපදිංචි කිරීම අනිවාර්යය වේද? හේතු දක්වන්න.
8. මෙම ව්‍යාපාරය ලියාපදිංචි කිරීමේදී අනිවාර්යයෙන් ලබාගත යුතු වාර්තාවක් නම් කරන්න.
9. ව්‍යාපාර සංවිධාන වර්ග කිරීමේදී මෙම ව්‍යාපාරය කුමන ව්‍යාපාර සංවිධාන වර්ගයට අයත්වේද?
10. ව්‍යාපාරය වැඩිදියුණු කිරීම සඳහා ණය මුදලක් ලබා ගැනීමට යාමට සුදුසු බැංකුවක් නම් කරන්න.

(ලකුණු $2x10=20$)

(02) 1. අවශ්‍යතා හා වුවමනා අතර වෙනස ලියා දක්වන්න. (ලකුණු 02)

2. පහත දැක්වෙන ප්‍රකාශ සත්‍ය නම් (✓) ලකුණද අසත්‍ය නම් (×) ලකුණද යොදන්න.
   (අ) ව්‍යාපාරයක් යනු මිනිස් අවශ්‍යතා සපුරාලීමට අවශ්‍ය විවිධ වූ භාණ්ඩ හා සේවා නිෂ්පාදනය කිරීම හෝ සැපයීම ආශ්‍රිත ආර්ථික කටයුත්තකි. (   )
   (ආ) පාරිභෝගිකයෙකුගේ අරමුණ වනුයේ තත්වයෙන් උසස් නිෂ්පාදිතයක් සාධාරණ මිලකට ලබාගැනීම වේ. (   )
   (ඉ) ව්‍යාපාර සඳහා යොදවන කායික දායකත්වය පමණක් ශ්‍රමය ලෙස හැඳින්වේ. (   )
   (ඊ) කළමණාකරුවන්ගේ ප්‍රධාන අරමුණ ප්‍රමාණවත් ලාභයක් ලැබීමයි. (   )

(ලකුණු $\frac{1}{2} x 4 = 2$)

3. සුමාලි සකස් කළ ආහාර පාන අලෙවි කිරීමේ ආයතනයක් ඇගේ නමින් පවත්වාගෙන යන්නීය.
   (අ) නිෂ්පාදිතයේ ස්වභාවය අනුව සුමාලි විසින් කරගෙන යනු ලබන ව්‍යාපාරය කුමක්ද? (ලකුණු 01)
   (ආ) සකස් කළ කෙටි ආහාර වෙළඳපලට ඉදිරිපත් කිරීමේදී සලකා බැලියයුතු කරුණු දෙකක් ලියන්න.

(ලකුණු 02)

4. (අ) ව්‍යාපාරයක අයිතිකරුවෝ යනු කවුරුන්දැයි හඳුන්වන්න. (ලකුණු 01)
(ආ) පහත සඳහන් පාර්ශවයන්ට අදාල අරමුණ බැගින් ලියන්න.
1. සැපයුම්කරුවෝ
2. ප්‍රජාව (ලකුණු 02)
(ලකුණු 10)

(03) 1. දිලීෂ තමා ජීවත් වන ප්‍රදේශයෙන් නැවුම් එළවළු සහ පළතුරු සපයාගෙන කුරුණෑගල, අනුරාධපුර ප්‍රධාන මාර්ග සමීපයේ එළවළු සහ පළතුරු අලෙවි සැලක් පවත්වාගෙන යයි. ව්‍යාපාරය සාර්ථක වත්ම සේවකයෙක් අලෙවි කටයුතු කරගෙන යාම සඳහා බඳවා ගන්නා ලදී. ඊට නුදුරින් එවැනිම ව්‍යාපාරයක් තවත් අයෙකු ආරම්භ කළේය.
(අ) ව්‍යාපාර පරිසරය ප්‍රධාන වශයෙන් වර්ග කළ හැකි ආකාර දෙක නම් කරන්න. (ලකුණු 01)
(ආ) ඉහත ඡේදය ඇසුරින් ව්‍යාපාර පරිසර වර්ග දෙකට අයත් බලවේගය බැගින් වෙන වෙනම ලියා දක්වන්න. (ලකුණු 01)

2. පහත සඳහන් ප්‍රකාශ සත්‍ය, අසත්‍ය බව ලියා දක්වන්න.
(අ) ව්‍යාපාරයක කටයුතු මෙහෙයවන්නෙත් මෙහෙයවීට අවශ්‍ය තීරණ ගන්නේ කළමණාකරුවන් විසිනි.
(ආ) 1954 අංක 14 දරණ සාප්පු හා කාර්යාල සේවක පනත නෛතික පරිසරයට අදාල වේ.
(ඉ) නවීන තාක්ෂණය ලබාගත හැකි වීම ගෝලීය පරිසරයෙන් සිදුවන හිතකර බලපෑමක් නොවේ.
(ඊ) ව්‍යාපාරයේ භූගෝලීය පිහිටීම නුසුදුසු වීම ව්‍යාපාරයකට ඇති තර්ජනයකි. (ලකුණු $\frac{1}{2} x 4 = 2$)

3. (අ) රටක ආර්ථික පරිසරයට අයත් සාධක දෙකක් ලියන්න. (ලකුණු 02)
(ආ) ගෝලීයකරණය යන්න හඳුන්වන්න. (ලකුණු 01)

4. සපුමල් තම පියාගෙන් ලද ආභාෂය හා දැනුම මත සිමෙන්ති ආශ්‍රිත භාණ්ඩ නිෂ්පාදන ව්‍යාපාරයක් ආරම්භ කළේය. එවැනි ව්‍යාපාරයක් ඒ අවට නොතිබීම සපුමල්ගේ ව්‍යාපාරයේ සාර්ථකත්වයට හේතුවක් විය. ඒ අනුව සපුමල්ගේ ව්‍යාපාරයේ,
(අ) ශක්තියක් (ලකුණු 01)
(ආ) අවස්ථාවක් ලියා දක්වන්න. (ලකුණු 02)
(ලකුණු 10)

(04) 1. (අ) රාජ්‍ය අංශයේ ව්‍යාපාර සංවිධාන යන්න හඳුන්වන්න.
(ආ) එවැනි ව්‍යාපාර සංවිධාන සඳහා නිදසුන් දෙකක් ලියන්න. (ලකුණු 02)

2. පහත සඳහන් ප්‍රකාශ සත්‍යයද, අසත්‍යයද යන්න දක්වන්න.
(අ) හවුල් ව්‍යාපාරයක සිටිය යුතු සාමාජික සංඛ්‍යාව තීරණය කර ඇත්තේ 2007 අංක 07 දරණ සමාගම් පනතට අනුවය.
(ආ) හවුල් ව්‍යාපාරයක සිටිය යුතු උපරිම හවුල් කරුවන් සංඛ්‍යාව 20 කි.
(ඉ) වරලත් ගණකාධිකාරිවරුන් කීපදෙනෙකු විසින් විගණන ආයතනයක් පවත්වාගෙන යාම හවුල් ව්‍යාපාර ක්‍රමයට අයත් නොවේ.
(ඊ) සමූපකාර සමිති වල කොටස් නිකුතුවෙන් ප්‍රාග්ධන රැස්කරගත හැකිය. (ලකුණු 02)

3. ව්‍යාපාරයක පරිමාණය තීරණය කිරීම සඳහා සලකා බලන සාධක දෙකක් ලියන්න. (ලකුණු 02)

4. සමාජ සුභසාධන අරමුණින් ක්‍රියාත්මක වන පෞද්ගලික අංශයේ ව්‍යාපාර සංවිධාන යක් ලෙස සමිති හැඳින්විය හැක. ඒ සඳහා නිදසුන් 02 සපයන්න. (ලකුණු 02)

5. මහා පරිමාණ ව්‍යාපාරයක් ආරම්භ කිරීමේදී පදනම් කර ගන්නා සාධක දෙකක් ලියන්න. (ලකුණු 02)
(ලකුණු 10)

(05) 1. සමිති සංවිධානයක් යනු කුමක්ද? (ලකුණු 02)

2. පහත සඳහන් ප්‍රකාශ සත්‍යයද, අසත්‍යද යන්න දක්වන්න
   (අ) හිමිකාරිත්වය පදනම්කරගෙන රාජ්‍ය අංශයේත් පෞද්ගලික අංශයේත් ව්‍යාපාර දක්නට ඇත.
   (ආ) රජයේ දෙපාර්තමේන්තු සංස්ථා හා සමූපකාර සමිති රාජ්‍ය අංශයට අයත් ව්‍යාපාර වේ.
   (ඉ) ශ්‍රී ලංකා රූපවාහිනී සංස්ථාවට නීතිමය පුද්ගල භාවයක් ඇති ව්‍යාපාර වේ.
   (ඊ) සමූපකාර සමිතියක් ආරම්භ කිරීමට අවම වශයෙන් සාමාජිකයන් 10 ක් සිටිය යුතුය. (ලකුණු 02)

3. ව්‍යාපාරයක නම ලියාපදිංචි කිරීමෙන් ලබාගත හැකි ප්‍රයෝජන දෙකක් ලියන්න. (ලකුණු 02)

4. නිමල් තම ඥාතියෙකු වන කමල් සමඟ නිමල්ගේ නිවස ඉදිරිපිට සේවිකාවන් 15 දෙනෙකු යොදවා මදුරුදැල් මැසීමේ ව්‍යාපාරයක් පවත්වාගෙන යයි.
   (අ) ජන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුවේ පරිමාණ අනුව වර්ග කිරීමේදි ඉහත ව්‍යාපාරය අයත් වන්නේ කුමන ව්‍යාපාර සංවිධානය වර්ගයටද?
   (ආ) හිමිකාරිත්වය අනුව වර්ග කළ විට එම ව්‍යාපාරය පෞද්ගලික අංශයේ ව්‍යාපාර කුමන ව්‍යාපාර සංවිධාන වර්ගයට අයත්වේද? (ලකුණු 02)

5. අමාත්‍යාංශයක් යටතේ ක්‍රියාත්මක වන මුළුමනින්ම රජයේ සෘජු පාලනයට යටත්වන ආයතන දෙපාර්තමේන්තු නම්වේ.
   (අ) ශ්‍රී ලංකාවේ ක්‍රියාත්මක වන දෙපාර්තමේන්තු සඳහා එක් නිදසුනක් ලියන්න.
   (ආ) දෙපාර්තමේන්තු වල එක් වාසියක් ලියන්න. (ලකුණු 02)

(ලකුණු 10)

* * *

**පළමු වාර පරික්ෂණය - 2018**
**ව්‍යාපාර හා ගිණුම්කරණ අධ්‍යනය**
**10 ශ්‍රේණිය - පිළිතුරු පත්‍රය**
**I කොටස**

| | | | |
|---|---|---|---|
| (1) 3 | (11) 4 | (21) 1 | (31) 3 |
| (2) 4 | (12) 2 | (22) 4 | (32) 4 |
| (3) 2 | (13) 4 | (23) 2 | (33) 3 |
| (4) 2 | (14) 3 | (24) 3 | (34) 2 |
| (5) 3 | (15) 4 | (25) 2 | (35) 3 |
| (6) 4 | (16) 2 | (26) 3 | (36) 4 |
| (7) 4 | (17) 4 | (27) 4 | (37) 4 |
| (8) 4 | (18) 2 | (28) 1 | (38) 1 |
| (9) 1 | (19) 3 | (29) 2 | (39) 3 |
| (10) 3 | (20) 3 | (30) 4 | (40) 2 |

**II කොටස**

(01) 1. භෞතික පැවැත්මක් තිබීම, ස්පර්ශ කළ හැකි වීම, සමජාතිය වීම, ගබඩා කළ හැකි වීම
2. භාණ්ඩ නිෂ්පාදන ව්‍යාපාර
3. කැටයම් කැපීමේ නිපුණතාව, ජාතික වෘත්තීය පුහුණු අධිකාරියේ පුහුණු පාඨමාලාවක් හදාරා තිබීම
4. භූමිය - දැව
ශ්‍රමය - වඩුකාර්මිකයාගේ ශ්‍රමය, සේවකයෝ
5. අයිතිකරු - ප්‍රසන්න සිල්වා, සේවකයෝ
6. ගණුදෙනුකරුවෝ, දැව සපයන්නෝ, තාක්ෂණික පරිසරය, ආර්ථික පරිසරය
7. ඔව්. ඔහුගේ සම්පූර්ණ නමින් හැර වෙනත් නමකින් ව්‍යාපාරය පවත්වාගෙන යන බැවිනි.
8. ග්‍රාම නිලධාරි වාර්තාව
9. තනි පුද්ගල ව්‍යාපාරයකි, පෞද්ගලික අංසයට අයත් ව්‍යාපාරයකි
10. ඕනෑම වාණිජ බැංකුවක් (2x10=20)

(02) 1. අවශ්‍යතා යනු ජීවත් වීම සඳහා මිනිසා විසින් අනිවාර්යයෙන්ම සපුරාගත යුතු දෑ වේ.
එහෙත් වුවමනා යනු මිනිස් අවශ්‍යතා සපුරා ගන්නා විවිධ ආකාර වේ. (ලකුණු 02)
2. (අ) ✓ (ආ) ✓ (ඉ) ✗ (ඊ) ✗ (ලකුණු 02)
3. (අ) භාණ්ඩ නිෂ්පාදන ව්‍යාපාරයකි (ලකුණු 01)
(ආ) පාරිභෝගික රුචිකත්වය, සමාජ තත්වය, ආදායම් මට්ටම (ලකුණු 02)
4. (අ) ව්‍යාපාරයකට සම්පත් සපයන පුද්ගලයෝ ව්‍යාපාරයක අයිතිකරුවන් ලෙස හඳුන්වයි. (ලකුණු 01)
(ආ) 1. සැපයුම්කරුවෝ - අඛණ්ඩ ඇණවුම් ලබාගැනීම , නිසි පරිදි මුදල් ලබා ගැනීම
2. ප්‍රජාව - පරිසරයට හිතකරව ව්‍යාපාර කටයුතු පවත්වාගෙන යන්නේ දැයි විමසා බැලීම
සමාජ සුභසාධනයට දායක වන්නේදැයි විමසා බැලීම (ලකුණු 02)

(03) 1. (අ) 1. අභ්‍යන්තර පරිසරය 2. බාහිර පරිසරය (ලකුණු 01)
(ආ) අභ්‍යන්තර පරිසරය - ව්‍යාපාරයේ අයිතිකරු දිලීෂ, සේවකයෝ
බාහිර පරිසරය - ගනුදෙනුකරුවෝ, තරඟකරුවෝ (ලකුණු 02)
2. (අ) සත්‍යයි (ආ) සත්‍යයි (ඉ) අසත්‍යයි (ඊ) අසත්‍යයි (ලකුණු 02)

3. (අ) පොලී අනුපාතය ජාත්‍යන්තර සම්බන්ධතා
උද්ධමනය විදේශ විනිමය අනුපාත
රැකියා නියුක්තිය ඉතුරුම්
ආදායම් ව්‍යාප්තිය (ලකුණු 02)
(ආ) ලෝකයේ රටවල් අතර ආර්ථික සමාජයීය හා සංස්කෘතික වශයෙන් අන්‍යෝන්‍ය බැඳීම ගෝලීයකරණය ලෙස හැඳින්වේ. (ලකුණු 01)
4. (අ) ශක්තියක් - පියාගෙන් ලද දැනුම (ලකුණු 01)
(ආ) අවස්ථාවක් - තරඟකාරී ව්‍යාපාරයක් ඒ අවට නොතිබීම (ලකුණු 01)

(04) 1. (අ) රජය විසින් ප්‍රාග්ධනය සපයා ඇති හිමිකාරිත්වය රජය සතු වූ ව්‍යාපාර රාජ්‍ය අංශයේ ව්‍යාපාර වේ. (ලකුණු 01)
(ආ) රජයේ දෙපාර්තමේන්තු, රාජ්‍ය සංස්ථා, රාජ්‍ය සමාගම් (ලකුණු 01)
2. (අ) සත්‍යයි (ආ) සත්‍යයි (ඉ) අසත්‍යයි (ඊ) අසත්‍යයි (ලකුණු 02)
3. ව්‍යාපාරයේ ප්‍රාග්ධන ප්‍රමාණය, භාවිතා කරන බලශක්ති ප්‍රමාණය, ව්‍යාපාරයට ඇති වෙළඳපල කොටස සේවක සංඛ්‍යාව (ලකුණු 02)
4. ගොවි සමිති, ක්‍රීඩා සමිති, මරණාධාර සමිති (ඕනෑම නිවැරදි පිළිතුරු) (ලකුණු 02)
5. ව්‍යාපාරයේ ස්වභාවය, ව්‍යාපාරිකයාගේ කැමැත්ත, ව්‍යාපාරිකයාට සපයා ගතහැකි සම්පත් (ලකුණු 02)

(05) 1. ලාභ ඉපැයීමේ අරමුණින් තොරව විශේෂයෙන් සාමාජිකයන්ට හා සමාජයටද යහපතක් සලසන අරමුණු ඇතිව සාමාජිකයන් විසින් පිහිටුවාගනු ලබන සංවිධාන සමිති සංවිධාන වේ. (ලකුණු 02)
2. (අ) සත්‍යයි (ආ) අසත්‍යයි (ඉ) අසත්‍යයි (ඊ) සත්‍යයි (ලකුණු $\frac{1}{2} x 4 = 2$)
3. අනන්‍යතාවයක් ලැබීම, ව්‍යාපාර නාමයේ අයිතිය තහවුරු වීම, රජයෙන් ලබාදෙන දිරිගැන්වීම් ලබා ගැනීමට සුදුසුකමක් වීම, ණය ලබා ගැනීමේදී පහසුවක් ලැබීම (ලකුණු 02)
4. (අ) සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර
(ආ) හවුල් ව්‍යාපාර (ලකුණු 02)
5. (අ) ශ්‍රී ලංකා දුම්රිය දෙපාර්තමේන්තුව, ශ්‍රී ලංකා තැපැල් දෙපාර්තමේන්තුව, කෘෂිකර්ම දෙපාර්තමේන්තුව (ලකුණු 01)
(ආ) අත්‍යවශ්‍ය සේවා සඳහා යොදා ගැනීම
මහා පරිමාණ සේවා සැපයිය හැකි වීම
රජයේ සේවක පිරිස් සිටීම
සැමට සමානව සැලකීම (ලකුණු 01)

* * *

සියලු හිමිකම් ඇවිරිණි/ All Rights reserved

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
**Provincial Department of Education - NWP**

60 S I

පළමු වාර පරීක්ෂණය - 10 ශ්‍රේණිය - 2018
First Term Test - Grade 10 - 2018

**විභාග අංකය ....................................** **ව්‍යාපාර හා ගිණුම්කරණ අධ්‍යනය - I** **කාලය පැය 01 යි**

**වැදගත් :**
- **සියලුම ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.**

(01) පහත දැක්වෙන අරමුණු අතරින් ව්‍යාපාර ආයතනයක දැකිය හැකි ප්‍රධානතම අරමුණක් වන්නේ,
i. මිනිස් අවශ්‍යතා හා වුවමනා සපුරාලීම ii. භාණ්ඩ හා සේවා නිෂ්පාදනය කිරීම
iii. ලාභ ඉපයීම iv. රැකියා උත්පාදනය

(02) පහත ලක්ෂණ අතුරින් අවශ්‍යතාවලට පමණක් අදාළ ලක්ෂණ ඇතුළත් කාණ්ඩය තෝරන්න.
i. අත්‍යවශ්‍ය වීම, විවිධ වීම, සීමිත වීම ii. පොදු වීම, සීමිත වීම, විවිධ වීම
iii. පොදු වීම, නිර්මාණය කළ හැකි වීම, අසීමිත වීම
iv. අත්‍යවශ්‍ය වීම, නිර්මාණය කළ නොහැකි වීම, සීමිත වීම

(03) පහත ව්‍යාපාර අතුරින් භාණ්ඩ නිෂ්පාදන ව්‍යාපාරයක් ලෙස දැක්විය හැක්කේ,
i. රූපලාවන්‍ය ආයතනයක් ii. බේකරි ආයතනයක්
iii. තොග වෙළඳ ආයතනයක් iv. රක්ෂණ ආයතනයක්

(04) නිෂ්පාදන සාධක සහ ඊට අදාළ උදාහරණ නිවැරදිව ගලපා ඇති පිළිතුර වන්නේ,
i. භූමිය - ගොඩනැගිලි ii. ශ්‍රමය - ගණකාධිකාරිවරු
iii. ප්‍රාග්ධනය - වනසම්පත් iv. ව්‍යවසාය - කළමණාකරු

(05) භාණ්ඩ හා සේවා අතර වෙනස හඳුනාගත හැකි ලක්ෂණයක් වන්නේ,
i. මිල මට්ටම ii. සැපයුම මත iii. ගබඩා කිරීමේ හැකියාව iv. සන්නම මත

(06) නිෂ්පාදිත භාණ්ඩ වෙළඳපොළට ඉදිරිපත් කිරීමේදී සලකා බලන සාධකයක් නොවන්නේ,
i. පාරිභෝගික ආදායම් මට්ටම ii. පාරිභෝගික රුචිකත්වය
iii. සමාජ තත්වය iv. අධ්‍යාපන මට්ටම

(07) ව්‍යාපාර ආයතන කිහිපයක් පහත දැක්වේ.
A. මෝටර්රථ නිෂ්පාදන ආයතන B. බැංකු ආයතන
C. අධ්‍යාපන ආයතන D. ජංගම දුරකතන නිෂ්පාදන ආයතන
E. ලී බඩු නිෂ්පාදන ආයතන
සේවා නිෂ්පාදන ව්‍යාපාර පමණක් ඇතුළත් පිළිතුර තෝරන්න.
i. A හා C ය ii. A හා B ය iii. A හා D ය iv. B හා C ය

(08) භෞතික ආයතන නොමැතිව වර්තමානයේ ව්‍යාපාර කටයුතු කෙරෙන අතර මේ සඳහා යොදා ගන්නා ප්‍රධාන පහසුකම වන්නේ,
i. ෆැක්ස් යන්ත්‍රය ii. දුරකතනය iii. පරිගණකය iv. තොරතුරු තාක්ෂණය

(09) ව්‍යාපාරයක ව්‍යාපාර සැලසුම් නිසිලෙස ක්‍රියාත්මක කිරීම හා නිවැරදි තීරණ ගැනීම කරනු ලබන්නේ,
i. කළමණාකරුවෝය ii. සේවකයෝය iii. අයිතිකරුවෝය iv. සැපයුම්කරුවෝය

(10) ව්‍යාපාරයක අයිතිකරුවන් විසින් පහත සඳහන් කුමන අරමුණු ඉටුකර ගැනීම සඳහා උනන්දු නොවන්නේද?
i. ප්‍රමාණවත් ලාභයක් ලබා ගැනීම ii. ව්‍යාපාරයේ අනාගත වර්ධනය
iii. සාධාරණ වැටුප් ලබා ගැනීම iv. ආයෝජනයේ සුරක්ෂිත බව

(11) බාටාර් ක්‍රමය ලෙස හඳුන්වන්නේ,
i. ස්වයං පෝෂිත අර්ථ ක්‍රමයයි  ii. තොරතුරු හුවමාරු ක්‍රමයයි
iii. මුදල් භාවිත ක්‍රමයයි  iv. අතිරික්ත භාණ්ඩ හුවමාරු ක්‍රමයයි

(12) අවශ්‍යතාවයක ලක්ෂණයක් නොවන්නේ,
i. සරළ බව  ii. පුද්ගලයාගෙන් පුද්ගලයාට වෙනස් වීම
iii. සීමිත වීම  iv. නිර්මාණය කළ නොහැකි වීම

(13) සිනෙත් විදේශ රටක සේවය කර ශ්‍රී ලංකාවට පැමිණ පොත් නිෂ්පාදන ආයතනයක් ආරම්භ කළේය. සිනෙත්ගේ ව්‍යාපාරයේ ඇල්මැති පාර්ශවයක් නොවන්නේ,
i. ජයසිරි පොත් නිෂ්පාදකයෝ  ii. සිනෙත්
iii. ලංකා බැංකුව  iv. සුවඳ සබන් නිෂ්පාදකයෝ

(14) සේවා සපයන ව්‍යාපාර ආයතන විශේෂයකි.
ii. සකස් කළ ආහාර පාන නිශ්පාදන ආයතන  ii. රෙදි යොදන යන්ත්‍ර නිශ්පාදන ආයතන
iii. බැංකු කටයුතු කරන ආයතන  iv. සිසිල් බීම නිශ්පාදන ආයතන

(15) පහත සඳහන් සාධක අතුරින් බාහිර පරිසරයට අයත් සාධක වනුයේ,
A. සේවකයෝ  B. තරඟකරුවෝ
C. කළමණාකරුවෝ  D. සැපයුම්කරුවෝ
i. A හා D ය  ii. C හා B ය  iii. A,B,C හා D ය  iv. B හා D ය

(16) ව්‍යාපාරයට අවශ්‍ය ප්‍රාග්ධනය යොදවන පුද්ගලයෝ ............ ① වන අතර ව්‍යාපාරය සතු සම්පත් මෙහෙයවීමට අවශ්‍ය තීරණ ගන්නා පුද්ගලයෝ ........... ② වෙති.
ඉහත ප්‍රකාශයේ 1 හා 2 යන ස්ථානවලට අදාළ නිවැරදි පිළිතුරු පිළිවෙලින් දැක්වෙනුයේ,
i. කළමණාකරුවෝ, අයිතිකරුවෝ  ii. අයිතිකරුවෝ, කළමණාකරුවෝ
iii. රජය, කළමණාකරුවෝ  iv. රජය, කළමණාකරුවෝ

(17) ව්‍යාපාරයක පැවැත්ම රඳා පවතිනුයේ,
i. සැපයුම්කරුවන් මතය  ii. තරඟකරුවන් මතය
iii. අයිතිකරුවන් මතය  iv. ගනුදෙනුකරුවන් මතය

(18) අද වන විට ශ්‍රී ලංකාව තුළ පවතින පොල් හිඟයට පිළියමක් ලෙස රජය විසින් පොල් ආනයනය කිරීම කුමන පරිසරයට අයත් සාධකයක් වේද?
i. ආර්ථික පරිසරය  ii. දේශපාලන පරිසරය
iii. නෛතික පරිසරය  iv. ගෝලීය පරිසර සාධකයකි.

(19) පාරිභෝගිකයාට පරිභෝජනයට ගත හැකි සුදුසු ආහාර පාන ව්‍යාපාරයක් විසින් සපයන්නේද, යන්න සොයා බලනුයේ,
i. සමාගම් රෙජිස්ට්‍රාර් වරයා  ii. මධ්‍යම පරිසර අධිකාරිය
iii. මහජන සෞඛ්‍ය පරීක්ෂක  iv. කම්කරු විනිශ්චය සභාව

(20) වර්ථමානයේදී පරිගණක හා තොරතුරු පද්ධති භාවිතා කරමින් ගිණුම් තැබීමේ ක්‍රියාවලිය සිදු කිරීම අයත්වන පරිසර සාධකය වනුයේ,
i. දේශපාලන පරිසරය  ii. ආර්ථික පරිසරය  iii. තාක්ෂණික පරිසරය  iv. නෛතික පරිසරය

(21) ආර්ථික පරිසරයට අයත් සාධකයක් නොවනුයේ ,
i. අයවැය ප්‍රතිපත්ති  ii. ආදායම් ව්‍යාප්තිය  iii. උද්ධමනය  iv. ඉතුරුම්

(22) දේශිය ව්‍යාපාර සඳහා ගෝලීය පරිසරයෙන් සිදුවන හිතකර බලපෑමක් වන්නේ,
i. දේශීය පුහුණු ශ්‍රමය විදේශිය රටවලට ආදි යාම
ii. දැඩි තරඟකාරිත්වයකට මුහුණ දීමට සිදුවීම
ii. දේශිය සංස්කෘතියේ අයහපත් වෙනස්කම් ඇතිවීම
iv. කාර්යක්ෂම යන්ත්‍ර සූත්‍ර ලබාගත හැකිවීම

(23) ජපානයේ භාවිතා වන මුදල් ඒකකය වනුයේ,
i. පවුම  ii. යෙන්  iii. යුවාන්  iv. ඩොලර්

(24) රජය විසින් ව්‍යාපාර සඳහා බදු සහන ලබා දීම ව්‍යාපාරයට .
i. ශක්තියකි  ii. දුර්වලතාවයකි  iii. අවස්ථාවකි  iv. තර්ජනයකි

25) ව්‍යාපාරයක අභ්‍යන්තර පරිසරය අධ්‍යනය කිරීම තුළින් හඳුනා ගත හැක්කේ,
i. ශක්තීන් හා අවස්ථාවන්ය ii. ශක්තීන් හා දුර්වලතාය
iii. අවස්ථා හා තර්ජනය iv. තර්ජන හා දුර්වලතාය

(26) 2017 ජනවාරි මස සිට බැංකුණය පොළී අනුපාතය ඉහළ දැමීම නිසා ව්‍යාපාර වලට වන බලපෑම වනුයේ,
i. ව්‍යාපාර විසින් ණය ගැනීමට පෙළඹීමයි
ii. ව්‍යාපාර විසින් වැඩි වැඩියෙන් මුදල් බැංකු ගිණුමේ තැන්පත් නොකරයි.
iii. ව්‍යාපාර විසින් ණය ගැනීම සීමා කරයි.
iv. භාණ්ඩ හා සේවා වල විකුණුම් මිල ඉහළ දැමීම .

(27) යම්කිසි ව්‍යාපාරයකට තරඟකරුවන් නිසා ඇතිවන බලපෑමක් නොවන්නේ,
i. තරඟකරුවන්ගේ නිෂ්පාදිතවල මිල ගණන් ii. තරඟකරුවන්ගේ භාණ්ඩ වල ගුණාත්මක භාවය
iii. තරඟකරුවන්ගේ අලෙවි උපක්‍රම iv. තරඟකරුවන්ගේ වත්කම්

(28) ස්වාධීන තීරණ ගැනීමට කැමති පසිඳුට ආරම්භ කිරීමට සුදුසු ව්‍යාපාර සංවිධානයකි.
i. කුමාරි ටෙක්ස් ii. සිල්වා සහ පුත්‍රයෝ iii. බින්දු සමාගම iv. තරුණ බෞද්ධ සමිතිය

(29) තනි පුද්ගල ව්‍යාපාරයකට සාපේක්ෂව හවුල් ව්‍යාපාරයක දක්නට ලැබෙන වාසියකි.
i. තීරණ ගැනීමේ ස්වාධින බව ii. වැඩි ප්‍රාග්ධනයක් රැස්කරගත හැකි වීම
ii. නීතිමය පුද්ගලභාවයක් තිබීම iv. අයිතිකරුවන්ගේ වගකීම සීමිත වීම

(30) කොටස් නිකුතුව මගින් විශාල ප්‍රාග්ධනයක් රැස්කරගත හැකි ව්‍යාපාරයකි,
i. හවුල් ව්‍යාපාර ii. සමිති iii. සමූපකාර iv. සමාගම්

(31) සමූපකාර සමිතියක් ලියාපදිංචි කළයුතු පනත වන්නේ,
i. 2007 අංක 07 දරණ සමාගම් පනත ii. 1918 ව්‍යාපාර නාම ආඥා පනත
iii. 1972 අංක 05 දරණ සමූපකාර පනත iv. 1840 වංචා වැලැක්වීමේ අදාළ පනත

(32) සමාජ සුභසාධන අරමුණින් පවත්වාගෙන යන ව්‍යාපාරයකට අයත් නොවන්නේ,
i. සමුපකාර සමිති ii. රාජ්‍ය දෙපාර්තමේන්තු
iii. මරණාධාර සමිති iv. සංස්ථාපිත සමාගම්

(33) අත්‍යවශ්‍ය සේවා සැපයීම සඳහා උචිත සුභ සාධන අරමුණින් පවත්වා ගෙන යන ව්‍යාපාරයකි.
i. සමූපකාර ii. සමිති iii. රාජ්‍ය සංස්ථා iv. පුන්‍යායතන

(34) ව්‍යාපාරයක වගකීම අසීමිත වූ නෛතික පුද්ගල භාවයක් නොමැති ව්‍යාපාර සංවිධාන ඇතුළත් කාණ්ඩය වනුයේ,
i. හවුල් ව්‍යාපාර - සංස්ථාපිත සමාගම් ii. හවුල් ව්‍යාපාර - කේවල ස්වාමි ව්‍යාපාර
iii. සංස්ථාපිත සමාගම් - කේවල ස්වාමි ව්‍යාපාර . iv. කේවල ස්වාමි ව්‍යාපාර - සමූපකාර සමිති

35) හවුල් ව්‍යාපාරයක් හවුල්කරුවන් අතර ඇතිකරගන්නා එකඟතාව මත ඇතිවන අතර එම එකඟතා ඇතිවිය හැකි ක්‍රම,
i. එකකි ii. දෙකකි iii. තුනකි iv. පහකි

(36) පහත සඳහන් ව්‍යාපාර අතරින් නීතිමය පුද්ගලභාවයක් ඇති ව්‍යාපාරයකි.
i. හවුල් ව්‍යාපාර ii. කේවල ස්වාමි ව්‍යාපාර
iii. දෙපාර්තමේන්තු iv. රාජ්‍ය සංස්ථා

(37) පාලනය රජය සතුවන ව්‍යාපාරයකි.
i. සමූපකාර ii. තනි පුද්ගල ව්‍යාපාර iii. සංස්ථාපිත සමාගම් iv. දෙපාර්තමේන්තු

(38) තනි පුද්ගල ව්‍යාපාරයක නම ලියාපදිංචි කළ යුත්තේ,
i. අදාල පළාත් සභාවේ ව්‍යාපාර නාම ප්‍රඥප්තිය යටතේය
ii. වංචා වැළැක්වීමේ ආඥා පනත යටතේය
iii. 2007 අංක 07 දරණ සමාගම් පනත යටතේය iv. 1890 හවුල් ආඥා පනත යටතේය.

(39) නුවන් තිලකරත්න "නුවන් ග්‍රොසරි" නමින් සිල්ලර ව්‍යාපාරයක් පවත්වාගෙන යයි. නුවන්ගේ ව්‍යාපාරය ලියාපදිංචි කළ යුත්තේ,

i. ආරම්භ කළ දිනය
ii. ආරම්භ කළ දින 14ට පසුය
iii. ආරම්භ කර දින 14ක් ඇතුළතය
iv. මෙය ලියාපදිංචි කිරීම අවශ්‍ය නැත.

(40) තනි පුද්ගල ව්‍යාපාරයක් ලියාපදිංචි කිරීමේදී අදාළ අයදුම්පත ලබාගත යුත්තේ,

i. සමාගම් රෙජිස්ට්‍රාර් කාර්යාලයෙනි
ii. ප්‍රාදේශිය ලේකම් කාර්යාලයෙනි
iii. ග්‍රාම නිලධාරි කාර්යාලයෙනි
iv. ප්‍රාදේශිය සභාවෙනි.

* * *